ihˆu yñlï weúßK
*All Rights Reserved*

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

**7 ශ්‍රේණිය** **නාට්‍ය හා රංග කලාව** **කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- දී ඇති උපදෙස් අනුව සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 15 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 නට්‍යයක් නිර්මාණය කිරීම

(1) සාමූහික ක්‍රියාවලියකි. (2) ඉතාම පහසු ක්‍රියාවලියකි.

(3) තනිව සිදුකළ හැකි ක්‍රියාවලියකි. (4) ඕනෑම අයෙකුට කළ හැකිය.

02 කථා වින්‍යාසය යන්නෙහි අරුත වන්නේ,

(1) සරල කථාවකට ය. (2) මුල, මැද, අග ගැළපීමයි.

(3) රංගනය මනාව පෙළගැස්මයි. (4) රංග විධාන සහිතව පිටපත ලිවීමයි.

03 වේදිකාව මත මොහොතින් මොහොත මැවෙන දර්ශන

(1) ප්‍රේක්ෂකයා ය. (2) ප්‍රේක්ෂාවයි. (3) රංග රටායි. (4) ර ං ග වින්‍යාසයයි.

04 ටයිටස් තොටවත්තයන්ගේ චිත්‍රපටියකි,

(1) හඳයා (2) බැම්බි (3) සමනල තටු (4) පුංචි සරුංගලේ

05 ආර්. කේ. නාරායන්ගේ නිර්මාණයකි,

(1) හඳයා (2) ස්වාමි සහ යහළුවෝ

(3) සරුංගලය (4) පුංචි අපට දුන් තේරෙයි

06 ''සමාරෝපය'' යන්නෙහි අරුත වන්නේ,

(1) අනුව ක්‍රියා කිරීමයි. (2) අංගරචනයයි.

(3) රූපණයයි. (4) චරිතයකට ප්‍රවිෂ්ඨවීමයි.

07 අනුශාංගික අංග ගොන්නට වැටෙන්නේ මින් කවරක්ද?

(1) රංගවිධාන හා සංගීතයයි. (2) ආලෝකය හා අංගරචනයයි.

(3) පිටපත හා සංවාදයයි. (4) සංගීතය හා පිටපතයි.

08 පෙර සූදානමකින් තොරව රූපණයෙහි යෙදීම

(1) සමාරෝපයයි. (2) අසරූපණයයි.

(3) ක්ෂණික නිරූපණයයි. (4) රංග අභ්‍යාසයයි.

09 වෙස්මුහුණු යොදාගනිමින් සිදුකරන නාටක විශේෂයකි

(1) කෝලම් (2) නූර්ති (3) කොහොඹාකංකාරිය (4) ආලවකදමනය

10 රංග වස්ත්‍ර නිර්මාණයේ දී

(1) දීප්තිමත් (දිලිසෙන) සුළු විය යුතුයි.

(2) සැහැල්ලු විය යුතුයි.

(3) අධික මිලකින් යුක්ත විය යුතුයි.

The National e-Learning Portal for The General Education

(4) පිටපතට අදාළ නොවුනමුත් අලංකාර විය යුතුයි.

11 ටිකිරි මැණිකේ නාට්‍ය නිර්මාණය කළේ,

(1) හෙන්රි ජයසේන (2) බර්නාඩ් ෂෝ

(3) උන්ඩි විලිපිලි (4) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්

12 ශිථිලකරණ අභ්‍යාස යන්නෙහි අරුත වන්නේ,

(1) ශරීරය සැහැල්ලු කිරීමේ අභ්‍යාසයි.

(2) සහන අභ්‍යාසයි.

(3) මානසික සැහැල්ලුව ඇතිකරන අභ්‍යාසයි.

(4) රූපණය සඳහා රූපණ ශිල්පියෙකු විසින් පුරුදු පුහුණු කළ යුතු අභ්‍යාසයි.

13 අංගරචනය අයත් අභිනය වන්නේ,

(1) ආංගික අභිනයයි. (2) වාචික අභිනයයි.

(3) ආහාර්ය අභිනයයි. (4) සාත්වික අභිනයයි.

14 ''රංග විධාන'' යනුවෙන් අදහස් කරන්නේ,

(1) නාට්‍ය ගීතයි. (2) චරිත අතර ඇති දෙබස්ය.

(3) පිටපතට අදාළ උපදෙස්ය. (4) ප්‍රේක්ෂකයන්ට ලබාදෙන උපදෙස්ය.

15 ''නළු වරණය'' යනු,

(1) නාට්‍ය පිටපත තෝරාගැනීමයි. (2) නාට්‍ය අධ්‍යක්ෂවරයෙකු තෝරාගැනීමයි.

(3) උචිත නළු නිළියන් තෝරාගැනීමයි. (4) මුදල් යොදවන්නන් තෝරාගැනීමයි.

● **අංක 16 සිට 20 දක්වා ඇති වාක්‍ය හරිනම් (✓) ලකුණ ද, වැරදිනම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

16 සතර අභිනය පිළිබඳව දක්වා ඇත්තේ භරතමුනිවරයා ය.( )

17 නාට්‍ය ශාස්ත්‍රය නම් ග්‍රන්ථය ඇරිස්ටෝටල්ගේ ය. ( )

18 නාට්‍ය පිළිබඳ ප්‍රථම ඉඟිය තේමාව විසින් ලබාදෙයි. ( )

19 පාත්‍රයා යනුවෙන් නළුවා හඳුන්වයි. ( ) (1 x 20 = 20)

20 නාට්‍යයකට සංගීතය අත්‍යවශ්‍ය අංගයකි. ( )

## II කොටස

● **ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. ප්‍රායෝගික පරීක්ෂණයට ල. 40 කි.**

01 රංගවිධාන සහිතව නාට්‍යයෝචිත අවස්ථා දක්වමින් ඓතිහාසික කථා පුවතක් ඇසුරෙන් නාට්‍ය පෙළක් ලියා දක්වන්න. (ල. 10)

02 (1) ළමා වේදිකා නාට්‍යයක දැකිය හැකි ලක්ෂණ 5 ක් ලියා දක්වන්න. (ල. 05)

(2) ළමා වේදිකා නාට්‍යයක් හා රූපවාහිනී ළමා චිත්‍රපට අතර වෙනස පහදන්න. (ල. 05)

03 (1) ඔබ දන්නා අනුශාංගික අංග 4 ක් නම් කරන්න. (ල. 05)

(2) පහත නාට්‍යයෝපකරණ අයත් අභිනය නම්කොට සකස් කිරීමට යොදාගනු ලබන ද්‍රව්‍ය නම්කරමින් සකස් කරනා අයුරු රූප සටහන් මගින් පහදන්න. (ල. 05)

( කඩුව / මාලය / උපැස් යුවල)

04 (1) ශිථිලකරණ අභ්‍යාස යන්න විස්තර කරන්න. (ල. 05) (10 x 4 = 40)

(2) නළුවෙකුට ශිථිලකරණ අභ්‍යාස වැදගත් වන ආකාරය කරුණු 5 කින් ලියා දක්වන්න.

The National e-learning Portal for The General Education